කොළඹ විශ්ව විද්‍යාලය- ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

**ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය-දෙවන සෙමෙස්තරය - 2016/2017**

**PSC 3251-දේශපාලන සහ සමාජ න්‍යායේ ප්‍රධාන ප්‍රවාහ II**

කාලය පැය දෙකයි (02)

ඕනෑ ම ප්‍රශ්න **හතරකට (04)** පිළිතුරු සපයන්න

එක් පිළිතුරකට උපරිම ලකුණු **පහළොවක් (15)** ක් ලැබේ

---

1 (අ) අන්තෝනියෝ ග්‍රම්ස්චි ගේ 'හෙජමොනිය' සංකල්පය පහදන්න.
(ආ) ග්‍රම්ස්චි එය සිවිල් සමාජයට සහ දේශපාලන සමාජයට සම්බන්ධ කළේ කෙසේදැයි පැහැදිලි කරන්න.

2 (අ) ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය ඇසුරෙන් විවේචක න්‍යායය පැහැදිලි කරන්න.
(ආ) විවේචක න්‍යාය සාම්ප්‍රදායික න්‍යායෙන් සහ විද්‍යාත්මක න්‍යායෙන් වෙනස් වන්නේ කෙසේ ද?

3 'පරමාදර්ශී කථන තත්ත්වය' සහ 'පරමාදර්ශී කථන ප්‍රජාව' ගැන හබර්මාස් ගේ අදහස් විභාග කරන්න.

4 ගුන්දර් ෆ්‍රැන්ක් සහ සමීර් අමීන් තෙවනි ලොව ඌන සංවර්ධනයට දැක් වූ හේතු සාකච්ඡා කරන්න.

5 එඩ්වඩ් සයිඩ් ගේ 'ප්‍රාචීනවාදය' යටත්විජිතවාදය සම්බන්ධයෙන් විවේචනාත්මක අවබෝධයක් වර්ධනය කළේ කෙසේ ද? විභාග කරන්න.

6 මිචෙල් ෆුකෝ ගේ න්‍යායික අදහස්වලට බලපෑ දාර්ශනික සහ බුද්ධිමය සම්ප්‍රදායන් මොනවා ද? සාකච්ඡා කරන්න.

7 පහත දැක්වෙන ඕනෑ ම දෙකක් (02) ගැන කෙටි සටහන් ලියන්න.

(අ) දෘෂ්ටිවාදය පිළිබඳ ලුවිස් අල්තුෂර් ගේ මතය
(ආ) සංකේතික ප්‍රාග්ධනය පිළිබඳ පියරේ බෝර්දියෝ ගේ අදහස
(ඇ) ෂාන් පෝල් ශාස්ත්‍රේ ගේ 'පැවැත්ම' සංකල්පය
(ඈ) ජැක් ලැකාන් ගේ 'කැඩපත් ප්‍රතිරූපය' සංකල්පය